# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.31 පැය 1105 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 181 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්‍ා වූ වැදගත් තොරතුරු</u>**

## 01. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පැලියගොඩ පොලිස් ස්ථානය

2025.01.30 වන දින රාත්‍රී කාලයේ පැළියගොඩ පොලිස් වසමේ 90 වත්ත ආසන්න ප්‍රදේශයේදී පැළියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන පැළියගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 35 ක් වන පැලියගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

පැලියගොඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - බොරලැස්ගමුව පොලිස් ස්ථානය

2025.01.30 වන දින රාත්‍රී කාලයේ බොරලැස්ගමුව පොලිස් වසමේ කළුවත්ත ආරාමය ආසන්න ප්‍රදේශයේදී බොරලැස්ගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 260 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 19 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

බොරලැස්ගමුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තෙලිප්පලේ පොලිස් ස්ථානය.

2025.01.30 වන දින රාත්‍රී කාලයේ තෙලිප්පලේ පොලිස් වසමේ වතර්‍ාවිලාන් සිවන් කෝවිල අසල ප්‍රදේශයේදී තෙලිප්පලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 100 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 18 ක් වන තෙලිප්ලලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තෙලිප්පලේ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. විදුලි සැර වැදීමෙන් පුද්ගලයකු මියයාම - මීගස්වැව පොලිස් ස්ථානය.

2025.01.30 වන දින සවස් කාලයේ මීගස්වැව පොලිස් වසමේ මහතලාකොලවැව ප්‍රදේශයේ පුද්ගලයකුට විදුලිසැර වැදී මිය ගොස් ඇති බවට ලද තොරතුරක් මත මීගස්වැව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් විමශර්නයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 24 ක් වන මහතලාකොලවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම මිය ගිය පුද්ගලයා ශබ්ද විකාශන යන්ත්‍රයක් අළුත්වැඩියා කිරීමට යාමේදී විදුලි සැරවැදීමෙන් මැදිරිගිරිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මිය ගොස් ඇත. 2025.01.31 වන දින පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වීමට නියමිතය.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**